දුම්රිය
புகையிரத
Railway – GMF 35

ඔබේ අංකය
உமது இல
Your No.

දුරකථනය (දු.සා)
தொலைபேசி (இ.பு.பொ.மு)
Telephone

*E- mail*: gmrsir@sltnet.lk

කාර්යාලය
அலுவலகம்
Office – 2421281

ෆැක්ස්
தொலைநகல்
Fax – 2446490

# ශ්‍රී ලංකා දුම්රිය සේවය
# இலங்கை புகையிரத சேவை
# SRI LANKA RAILWAYS

මගේ අංකය
எனது இல
My No. – GMR/Media/03/03

සාමාන්‍යාධිකාරි කාර්යාලය,
තැ.පෙ. 355, ඕල්කොට් මාවත,
කොළඹ 10.

பொது முகாமையாளர்
அலுவலகம்
த. பெ. 355இ ஒல்கொட்
மாவத்தை
கொழும்பு 10

General Manager's Office,
P.O. Box 355, Olcott Mawatha,
Colombo 10.

දිනය
தேதி
Date – 2025/12/09

ප්‍රවෘත්ති අධ්‍යක්ෂක ජනරාල්,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

<u>**ස්වභාවික ආපදා තත්වයෙන් පසු දුම්රිය සේවය කොටස් වශයෙන් යථාවත් කිරීම.**</u>

අඹේපුස්ස - අලව්ව අතර බුජ්ජොමුව දුම්රිය ස්ථානය ආසන්නයේ දුම්රිය මාර්ගයේ පැවති පැරණි ගඩොලින් කරනලද ආරුක්කු හැඩති බෝක්කුව, අසලින් ගලා බසින මාඔය දෙසට තල්ලු වී කැඩීයාම හේතුවෙන් දුම්රිය මාර්ගය යටින් අඩි 45 ක පමණ කුහරයක් සැදීම නිසා ප්‍රධාන මාර්ගය අවහිර වීමෙන් ප්‍රධාන, උතුරු සහ නැගෙනහිර දුම්රිය මාර්ග වල දුම්රිය ධාවනය ඇණ හිටින ලදී. මේ හේතුවෙන් දුම්රිය ධාවනය කොළඹ කොටුව සිට අඹේපුස්ස දකවා සීමා කරන ලදී.

දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ස්වේච්ඡා කණ්ඩායම් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ශ්‍රම දායකත්වයෙන් අඹේපුස්ස - අලව්ව අතර බුජ්ජොමුව දුම්රිය මාර්ගයේ පැවති අවහිරය ඉවත්කර 2025/12/09 දින දුම්රිය මාර්ගය යථාවත් කරන ලදී.

ඒ අනුව 2025/12/10 වන දින උදෑසන කාර්යාල දුම්රිය ධාවනය පහත පරිදි සිදුකිරීමට දුම්රිය දෙපාර්තමේන්තුව සැලසුම් කර ඇත.

| | සිට /දක්වා | දුම්රිය පිටත් වන වෙලාව |
|---|---|---|
| 1 | රඹුක්කන සිට කොළඹ කොටුව | පෙ.ව.03.25 |
| 2 | රඹුක්කන සිට කොළඹ කොටුව | පෙ.ව.04.05 |
| 3 | රඹුක්කන සිට කොළඹ කොටුව | පෙ.ව.04.50 |
| 4 | රඹුක්කන සිට කොළඹ කොටුව | පෙ.ව.05.20 |
| 5 | රඹුක්කන සිට කොළඹ කොටුව | පෙ.ව.05.57 |
| 6 | පොල්ගහවෙල සිට කොළඹ කොටුව | පෙ.ව.03.25 |
| 7 | පොල්ගහවෙල සිට කොළඹ කොටුව | පෙ.ව.05.20 |
| 8 | පොල්ගහවෙල සිට කොළඹ කොටුව | පෙ.ව.06.22 |
| 9 | කුරුණෑගල සිට කොළඹ කොටුව | පෙ.ව.06.15 |
| 10 | ගනේවත්ත සිට කොළඹ කොටුව | පෙ.ව.03.55 |
| 11 | අඹේපුස්ස සිට කොළඹ කොටුව | පෙ.ව.04.10 |
| 12 | අඹේපුස්ස සිට කොළඹ කොටුව | පෙ.ව.05.35 |
| 13 | අඹේපුස්ස සිට කොළඹ කොටුව | පෙ.ව.06.30 |
| 14 | අඹේපුස්ස සිට කොළඹ කොටුව | පෙ.ව.07.20 |
| 15 | මීරිගම සිට කොළඹ කොටුව | පෙ.ව.06.00 |
| 16 | මීරිගම සිට කොළඹ කොටුව | පෙ.ව.06.30 |
| 17 | මීරිගම සිට කොළඹ කොටුව | පෙ.ව.06.50 |
| 18 | මීරිගම සිට කොළඹ කොටුව | පෙ.ව.07.00 |
| 19 | වේයන්ගොඩ සිට කොළඹ කොටුව | පෙ.ව.05.50 |

| | | |
|---|---|---|
| 20 | වේයන්ගොඩ සිට කොළඹ කොටුව | පෙ.ව.06.35 |
| 21 | නාත්තන්ඩිය සිට කොළඹ කොටුව | පෙ.ව.04.25 |
| 22 | නාත්තන්ඩිය සිට කොළඹ කොටුව | පෙ.ව.05.25 |
| 23 | නාත්තන්ඩිය සිට කොළඹ කොටුව | පෙ.ව.06.35 |
| 24 | කොච්චිකඩේ සිට කොළඹ කොටුව | පෙ.ව.06.40 |

2025/12/10 දින සවස කොළඹ කොටුව සිට රඹුක්කන, පොල්ගහවෙල, කුරුණෑගල, ගනේවත්ත සහ මහව දක්වා කාර්යාල දුම්රිය ධාවනය කරවීමට සැලසුම් කර ඇත.

දුම්රිය ධාවනයේ සිදුකල ඉහත වෙනස්වීම් පිළිබඳ ජනමාධ්‍ය මගින් මගී ජනතාව දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිමි.

G.D.A සමරසිංහ
අධිකාරි (ගමනාගමන)
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට